නාවලපිටිය නගර සභාව
මහනුවර දිස්ත්‍රික්කය
--------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
---------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට නාවලපිටිය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
------------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සභාව සතු නොවූ රු.113,000 ක් වටිනා වාහන 2 ක් ප්‍රාග්ධනිත කර තිබුණි. | නිවැරදිව ගිණුම් තැබිය යුතුවේ. | වත්කම් ප්‍රාග්ධනිත කර තිබුණු බව වාර්තා කරමි. |
| (ii) | කාර්යාල මේස 5 ක වටිනාකම රු.154,475 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් තැබිය යුතුවේ. | විගණනයෙන් පෙන්වා දී ඇති අඩුපාඩුව පිළිගනිමි. |
| (iii) | රු.284,060 ක් වටිනා ආදායම් 2 ක් ආදායම් වියදම් ගිණුමට හා ලැබිය යුතු ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් තැබිය යුතුවේ. | මෙම වටිනාකම් ආදායම් වියදම් ගිණුමේ සටහන් කර ඇති බව වාර්තා කරමි. |
| (iv) | ගෙවිය යුතු රු.849,194 ක කර්මාන්ත ණයහිමි ශේෂ 6 ක් හා එකතුව රු.194,222 ක් වූ විවිධ ණයහිමි ශේෂ 25 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් තැබිය යුතුවේ. | සමුච්චිත අරමුදලෙන් ගෙවන බැවින් ණයහිමි ලෙස ගිණුම්ගත නොකරන බව වාර්තා කරමි. |
| (v) | ස්ථාවර තැන්පත් පොළිය රු.76,664 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් තැබිය යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ආ) නොසැසඳුණු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.8,430,113 ක් වූ ගිණුම් ශේෂ 3 කට අදාළ ශේෂයන් හා උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.412,699 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා නිවැරදි කිරීම් කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව වාර්තා කරමි. |

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (i) | වසර 5ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂය රු.701,821 වී තිබුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | සමහර ණයගැති මුදල් ලැබී ඇති අතර ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ii) | ගෙවිය යුතු ගිණුම් ශේෂ 2 ක වටිනාකම රු.7,523,725 ක් වසර 5 ක කාලයක් ඉක්මවා තිබුණද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ගෙවිය යුතු මුදල් ඉදිරියේදී ගෙවා අවසන් කරමි. |

(ඈ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වටිනාකම රු.81,317,448 ක් වූ ගිණුම් විෂයයන් 4 කට අදාළව උප ලේඛන සහ ශේෂ සනාථ කිරීම් යනාදී සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | ගිණුම්ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | පිළිතුරු සමඟ උපලේඛන ඉදිරිපත් කරමි. |

1.4 අනුකූල නොවීම

----------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---------------------------------------------------------------------------------

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | නගර සහා ආඥා පනතේ 157(6)(උ) වගන්තිය හා 2016 ඔක්තෝබර් 30 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය | දැන්වීම් පුවරු ගාස්තු රු.320,248 ක් අයකර නොතිබුණි. | දැන්වීම් පුවරු ගාස්තු අයකර ගත යුතුවේ. | ඉදිරියේදී අය කර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371(ඇ) | රු.812,031 ක් වටිනා අතුරු අග්‍රිම පියවා නොතිබුණි. | අග්‍රිම පියවීමට කටයුතු කළ යුතුවේ. | රු.609,772 ක මුදලක් තවදුරටත් අයකළ යුතුව පවතී. |
| (ඇ) | 2016 මාර්තු 17 දිනැති අංක 2016/03 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | | | |
| | (i) 5(1) වගන්තිය | වෙළඳ සංකීර්ණවල තක්සේරුගත කුලිය වසර 5 කට වරක් සංශෝධනය කර නොතිබුණි. | චක්‍රලේඛයට අනුව කටයුතු කළ යුතුවේ. | තක්සේරු කිරීමට කටයුතු කරමි. |
| | (ii) 10 ඡේදය | කඩකාමර විවිධ පුද්ගලයන් වෙත අතුරු බදු දීම සිදු කර තිබුණි. | චක්‍රලේඛයට අනුව කටයුතු කළ යුතුවේ. | අතුරු බදුකරු හඳුනාගෙන නීත්‍යානුකූල කිරීමට කටයුතු කරමි. |
| | (iii) 12 ඡේදය | අවසරයකින් තොරව සුපිරි වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 14 ක ස්වරූපය වෙනස් කර තිබුණි. | චක්‍රලේඛයට අනුව කටයුතු කළ යුතුවේ. | 2019 අප්‍රේල් 04 මහ සභාවේදී කරුණු අනාවරණය විය. ඒ අනුව සභා වාර්තා පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඉදිරි කටයුතු කරමි. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006 හි 2.7.7 හා 2.8.5 වගන්ති | රු.393,908 ක මිලදී ගැනීම් සම්බන්ධව ප්‍රසම්පාදන හා තාක්ෂණ කමිටු තීරණ නොවීය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුවේ. | අවශ්‍යා අවස්ථා වලදී තාක්ෂණ ඇගයීම් කමිටුවට යොමුකර මිලදී ගැනීම් කර ඇති බව වාර්තා කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.44,664,940 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.15,890,776 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 14,313,751 | 13,101,409 | 10,232,626 | 10,101,074 | 14,465,399 | 16,637,619 | 13,191,497 | 12,460,213 |
| (ii) | කුලී | 23,607,529 | 6,895,236 | 5,697,443 | 2,268,196 | 19,778,798 | 18,316,311 | 17,227,508 | 2,661,611 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,960,000 | 1,550,889 | 1,564,889 | (14,000) | 1,573,720 | 1,558,479 | 1,558,479 | - |
| (iv) | වෙනත් ආදායම් | 14,227,280 | 30,274,978 | 13,855,845 | 19,545,294 | 10,486,880 | 12,849,030 | 16,172,072 | 2,680,747 |
| | | 54,108,560 | 51,822,512 | 31,350,803 | 31,900,564 | 46,304,797 | 49,361,439 | 48,149,556 | 17,802,571 |

#### 2.2.2 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ රැස්කළ යුතු සමස්ථ ආදායම රු.69,625,083 ක් වුවද, වර්ෂය තුළ රැස් කරන ලද ආදායම රු.31,350,803 ක් වීමෙන් ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය සියයට 45 ක් විය. | හිඟ ආදායම් අයකර ගත යුතුවේ. | නිරීක්ෂණය පිළිගනිමි. |

#### 2.2.3 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රජයේ ආයතන 11 ක හිඟ වරිපනම් බදු ශේෂය රු.5,444,083 ක් විය. | හිඟ වරිපනම් අය කර ගත යුතුවේ. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. |

2.2.4 වෙනත් ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වසර 1 - 6 ත් අතර කාලයක සිට අයවිය යුතු පොහොර විකිණීමෙන් ලැබිය යුතු ආදායම රු.878,955 ක් විය. | මෙම මුදල් කාලීනව නිරවුල් කර ගත යුතු වේ. | CECB ආයතනයෙන් අය වීමට ඇති මුදල සුපිරි වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සම්බන්ධව ගෙවීමට ඇති මුදලට හිලව් කිරීමට එකඟ වී ඇත. |

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.393,383 ක් හා මුද්දර ගාස්තු රු.6,500,000 ක් විය. | අදාළ මුදල් සභාව වෙත ගෙන්වා ගත යුතු වේ. | උසාවි දඩ මුදල් රු.446,886 ක් හා මුද්දර ගාස්තු රු.5,696,010 ක් ලැබී ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| නගර සභා ආඥා පනතේ 157 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 15 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් කාරණා 3 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | සභාවට ආදායම් උපයාගතහැකි අතුරු ව්‍යවස්ථා පනවා ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතුවේ. | අතුරු ව්‍යවස්ථා 10 න් 7 ක් සමාලෝචනය සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවට යොමුකර ඇත. |

(ආ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ඉඹුල්පිටිය ඔසු උයන වෙනුවෙන් රු.100,000 ක් වැයකර දැල් වැටක් ගසා තිබුණද ඔසු පැළ වගා කර නොතිබුණි. | වත්කම්වලින් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගත යුතු වේ. | ඔසු උයන සකස් කිරීමට ඉදිරියේදී කටයුතු කරමි. |

(ඇ) අපේක්ෂිත ප්‍රතිලාභ (out come) ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සුපිරි වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 15 ක් හා නිවාස 5 ක් වසාදමා ඇති අතර, ආදායම් උත්පාදනය කර නොතිබුණි. | සභාව සතු වත්කම් ප්‍රයෝජනයට ගෙන ආදායම් උත්පාදනය කළ යුතු වේ. | නිවාස 2 ක් මුද්‍රා තබා ඇති අතර, ටෙන්ඩර් කළද ගැනුම්කරුවකු ඉදිරිපත් නොවීය. කඩ කාමර 3 ක් ගැනුම්කරුවන්ගේ ඉල්ලීම මත ලබා දී ඇති බව වාර්තා කරමි. |

(ඈ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නගර සභාවේ දිනකට එකතුවන ටොන් 08 ක පමණ කසළවලින් දිරන කසළ, යොදාගෙන සැකසූ පොහොර කසළ මධ්‍යස්ථානය තුළ ගොඩ ගැසී තිබුණි. පොහොර මිලදී ගැනීම සඳහා නගර සභාව ආයතනයක් සමඟ ගිවිසුම්ගත වුවද, එම ආයතනය මෙම ව්‍යාපෘතිය අතහැර දමා ගොස් තිබූ අතර, රු.664,090 ක මුදලක් අයවිය යුතුව පැවතුණි. නොදිරන කසළ මධ්‍යස්ථානයේ පරිසරයට හානිවන අයුරින් ගොඩගසා පුළුස්සා තිබුණි. | හිඟ මුදල් අයකර ගත යුතු අතර, නොදිරන කසළ විධිමත්ව බැහැර කළ යුතුවේ. | බයෝ සිස්ටම් ආයතනය සමඟ හිඟ මුදල් අයකර ගැනීමට ගිවිසුම්ගතව මෙම ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීමට කටයුතු කරන බව දන්වමි. |

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟාකර ගැනීමට හා ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශකයන් හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟාකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සුපිරි වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 4 ක් රු.6,750,000 කට විකුණා තිබුණි. | කඩ කාමර අතුරු බදු ලබාදීම සම්බන්ධයෙන් පරීක්ෂාකර තීරණ ගත යුතුවේ. | කඩ කාමර අතුරු බදු දීම නගර සභාවට පාලනය කිරීමට නොහැක. අතුරු බදුකරු හඳුනාගෙන නීත්‍යානුකූල කිරීමට කටයුතු කරමි. |
| (ආ) සුපිරි වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 9 ක් වසා තිබුණු අතර, රු.458,355 ක කුලී මුදලක් අයවිය යුතුව තිබුණි. කඩ කාමර 6 ක් මුද්‍රා තබා තිබුණු අතර ඒ හේතුවෙන් සභාවට ලැබිය යුතු ආදායමක් අහිමි වී තිබුණි. | වෙළඳ සංකීර්ණවල කඩ කාමර විවෘතව පැවතිය යුතු අතර අයවිය යුතු ආදායම් අයකර ගත යුතුවේ. | මුද්‍රා තැබූ කඩ කාමර අවස්ථා දෙකකදී ටෙන්ඩර් කිරීමට කටයුතු කළද කිසිදු ගැනුම්කරුවකු ඉදිරිපත් නොවූ බව වාර්තා කරමි. |
| (ඇ) නගර සභාව සතු නිවාස 2 ක් ගිවිසුම් රහිතව 2010 බදු දී තිබුණද රු.2,200,000 ක් එකවර ගෙවීමේ මුදල් අයකර නොතිබීම හේතුවෙන් 2016 අගෝස්තු මුද්‍රා තබා තිබූ අතර නැවත බදු දීමට කටයුතු කර නොතිබුණි. | ටෙන්ඩර් ලබාදී ආදායම් ඉපයීමට කටයුතු කළ යුතුවේ. | ටෙන්ඩර් ලබාදීමට කටයුතු කළද කිසිදු ගැනුම්කරුවෙකු ඉදිරිපත් නොවූ බව වාර්තා කරමි. |

3.3 මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සේවක අතිරික්තතා 01 ක් හා සේවක පුරප්පාඩු 16 ක් විය. | අදාළ පුරප්පාඩු සම්පූර්ණ කරවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | සේවකයින් බඳවා ගැනීමට කටයුතු කරමි. |
| (ආ) සේවය හැර ගිය, ස්ථාන මාරු හා විශ්‍රාමික නිලධාරීන් 33 දෙනෙකුගෙන් රු.785,879 ක ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සේවක ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සුපිරි වෙළඳ සංකීර්ණයේ කඩ කාමරවල තක්සේරුව ක්‍රියාත්මක නොකිරීමෙන් රු.12,360,940 ක කුලී ආදායමක් අය කරගෙන නොතිබුණි. | නව තක්සේරුව ක්‍රියාත්මක කර කඩකුලී අයකර ගත යුතුවේ. | නව තක්සේරුවට කඩ හිමියන්ගේ විරෝධතා ඉදිරිපත් කර ඇත. තක්සේරු දෙපාර්තමේන්තුවෙන් කඩ කුලී සංශෝධනය කරන ලෙස ඉල්ලා ඇත. |
| (ආ) | ටෙන්ඩර් පටිපාටිය හා නගර සභා ආඥා පනතේ විධි විධාන නොසලකා සුපිරි වෙළඳ සංකීර්ණයේ අංක 173 දරන මිනි තියටරය දීර්ඝකාලීනව බදු දී තිබූ අතර ගිවිසුමෙහි 05 ඡේදය ප්‍රකාරව ඇප සුරැකුම්, එකවර ගෙවීමේ මුදල් රු.500,000 ක් අය නොවී තිබූ අතර, නව තක්සේරුව ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් රු.120,000 ක ආදායමක් ද අහිමි වී තිබුණි. | එකවර ගෙවීමේ මුදල් අයකිරීම හා නව තක්සේරුව ක්‍රියාත්මක කර කුලී අය කරගත යුතුවේ. | මිනි තියටරය බදු දීමට අදාළ ලේඛන පරීක්ෂාවේදී රු.500,000 ක් ගෙවා නොමැති බව තහවුරු වේ. මේ සම්බන්ධව දැනුම් දී ඇතත් ගෙවා නොමැත. නීති අංශයෙන් ලැබෙන උපදෙස් මත අවශ්‍ය ඉදිරි කටයුතු කරමි. |
| (ඇ) | 2008 වර්ෂයේ වරිපනම් තක්සේරුව මත 2018 වර්ෂය දක්වාම වරිපනම් අය කර තිබුණි. | කාලීනව වරිපනම් තක්සේරු කර ආදායම් අයකර ගත යුතුවේ. | වරිපනම් ලේඛන යාවත්කාලීන කරන බවත් ඉන් අනතුරුව තක්සේරුව ලබා ගැනීමට කටයුතු කරන බව වාර්තා කරමි. |

## 3.5 ප්‍රසම්පාදනය

### ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | 2019 වසරේ සිට ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ඇත. |

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-------------------------------------------

අයවැය පාලනය

---------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------------- | -------------- | --------------------------- |
| (අ) | වැය විෂයන් 32 ක් සඳහා සලසා දී තිබුණු රු.3,941,100 ක ප්‍රතිපාදනවලින් කිසිදු වියදමක් නොදරා සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි. | තාත්වික අයවැයක් පිළියෙල කළ යුතුවේ. | පිළිගනිමි. |
| (ආ) | ආදායම් විෂයන් 3 ක ඇස්තමේන්තු කර තිබූ රු.510,000 ක ආදායමෙන් කිසිදු ඉපයීමක් සිදුකර නොතිබුණි. | තාත්වික අයවැයක් පිළියෙල කළ යුතුවේ. | පිළිගනිමි. |